# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 161 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 28/01/2024 පැය 1225

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයක් - මහකුඹුක්කඩවල පොලිස් වසම**

2024.01.25 වන දින රාත්‍රී කාලයේදී අසනීප තත්වයක් හේතුවෙන් ආණමඩුව රෝහලට ඇතුලත්ව ප්‍රතිකාර ලබමින් සිටි පුද්ගලයෙක් 2024.01.26 වන දින මියගොස් ඇති අතර මියගිය පුද්ගලයාගේ මරණය සැකකටයුතු බවට මහකුඹුක්කඩවල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරන ලදී.

සිදු කරන ලද විමර්ශනයේදී 2024.01.22 වන දින රාත්‍රී කාලයේදී නිවසක පැවති සාදයක් අතරතුරදී එම ස්ථානයේ සිටි පුද්ගලයෙකු හා මරණකරු අතර ගැටුමක් ඇති වී, එය සමථයට පත් කිරීමට එම ස්ථානයේ සිටි තවත් පුද්ගලයෙකු ක්‍රියාකිරීමේදී ඔවුන් තිදෙනාම බිම ඇද වැටී ඇත. එම සිදුවීමෙන් පසු මරණකරු නිවසට ගොස් සිටියදී 2024.01.25 වන දින රාත්‍රී මරණකරුට ඇතිවූ අධික හිසරදයක් හේතුවෙන් ආණමඩුව රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා පුත්තලම රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ පූනවිටිය, ආඬිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මේ සම්බන්ධයෙන් ආණමඩුව ගරු මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති අතර මෙම ඝාතනයට සැකපිට සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය ආණමඩුව රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇති අතර මහකුඹුක්කඩවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හදිසි මරණයක් - වැලිකන්ද පොලිස් වසම.**

2022.08.27 වන දින සවස් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ වැලිකන්ද රෝහලට මියගිය පුද්ගලයෙකු ඇතුලත් කර ඇති බවට වැලිකන්ද පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 40 ක් වූ නවසේනපුර, වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ හිස ප්‍රදේශයේ තුවාලයක් සිදුව ඇති බවත්, මොහු මානසික රෝගී තත්වයකින් පෙළුණු අයෙකු බවත් සිදුකල විමර්ශණයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - මීරිගම පොලිස් වසම.

2024.01.28 වන දින අළුයම් කාලයේ මීරිගම පොලිස් වසමේ මීරිගම ගිරිවුල්ල ප්‍රධාන මාර්ගයේ ඉදිපරපේ ප්‍රදේශයේදී, මීරිගම දෙස සිට පස්යාල දෙසට ධාවනය වූ බස් රථයක් මාර්ගය අයිනේ තිබූ විදුලි පහන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බස් රථයේ ගමන්ගත් කාන්තාවන් දෙදෙනෙකු හා පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු තුවාල ලබා මීරිගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පිරිමි පුද්ගලයෙකු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 67 ක් වූ කහවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මීරිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.